# මොඩියුල අංක 03

# පාසල හා ප්‍රජාව

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# පාසල හා ප්‍රජාව



## හැඳින්වීම

පාසල හා ප්‍රජාව යනු පුළුල් අර්ථයක් ගැබ් වූ සංකල්පයක් වේ. ඉගෙනුම් ඉගැන්වීම් සංසිද්ධීන් පාසල තුළ ඵලදායීව ක්‍රියාත්මක කිරීම පාසලේ සිටින ගුරුවරුන් ප්‍රමුඛ නිලධාරීන්ට පමණක් කළ නොහැකිය. පාසලේ ඉගෙනුම් සංසිද්ධීන් අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක කිරීමට පාසල් ප්‍රජාව ගේ සම්බන්ධ වීම හා සහාය, අන්තර් සබඳතාව අත්‍යවශ්‍ය වේ.

## අරමුණු

**අධ්‍යාපන කේන්ද්‍රීය සමාජයක් සඳහා ප්‍රජා පාදක අධ්‍යාපනය නිවැරදිව භාවිතා කිරීම.**

මෙම අරමුණු ඉටුවීමෙන් පහත දැක්වෙන ඉගෙනුම් ඵල වෙත යොමු වෙයි.

## ඉගෙනුම් ඵල

1) **පාසල හා ප්‍රජාව සංකල්පය පැහැදිලි කරයි.**
2) **පාසල හා ප්‍රජාව අතර සබඳතාවේ ස්වරූපය විග්‍රහ කරයි.**
3) **අධ්‍යයන කේන්ද්‍රයීය සමාජයක් සඳහා පාසල හා ප්‍රජා සබඳතා භාවිතා කරයි.**

### මාතෘකා පෙලගැස්ම

1. පාසල, ප්‍රජාව හා පාසල් ප්‍රජාව
2. පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය
3. ගුරුවරයා සහ පාසල් ප්‍රජාව
4. පාසල හා ප්‍රජාව අතර අන්තර් සබඳතාවය බල පවත්වාගෙන යන ආකාරය
5. ඵලදායි පාසල් ප්‍රජා සබඳතා වැඩසටහන් සංවිධානය

විෂය අන්තර්ගතය අධ්‍යයනයට පෙර සූදානමක් ලෙස පහත දැක්වෙන ප්‍රශ්න වලට උත්තර ලබා දෙන්න.

පිළිතුර සඳහා √ හෝ X ලකුණ යොදන්න.

1. දෙමාපියන් පාසලේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කරගැනීම කාර්ය පහසුවට හේතු වේ.
2. සියලුම දෙමව්පියන් තම දරුවන්ගේ පාසලට පැමිණීමට කැමැත්තක් ද දක්වති.
3. පාසල් ප්‍රජාව වශයෙන් හඳුන්වන්නේ එම පාසලේ දරුවන්ගේ දෙමව්පියන් හා වැඩිහිටියන් ය.
4. පාසලෙන් ප්‍රජාවටත් ප්‍රජාවගෙන් පාසලටත් ඵලදායී සේවාවක් සිදුවීම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට හේතු වේ.
5. තිරසාර සංවර්ධනයක් අඛණ්ඩව සිදු වීමට පාසල් ප්‍රජාවගේ සවිබලගැන්වීම් පාසල තුළින් සිදු වීම අත්‍යවශ්‍ය වේ.
6. ගෝලීය ප්‍රජාව පාසල් ප්‍රජාවට ඇතුලත් නොවේ.
7. පාසල් සංවර්ධනය සඳහා පාසලට සුබ පතන විවිධ පුද්ගලයින්ගේ සහය ලබා ගැනීම සුදුසුය.
8. පාසල ප්‍රජාවෙන් යැපෙන විට ප්‍රජා සංවර්ධනයට පාසලෙන් යම් මෙහෙයක් සිදු නොවේ.
9. වර්තමානයේ පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය දුරස්වීම පාසල් සංවර්ධනයට හේතු වී ඇත.
10. පාසල සමස්ත සමාජයේ උප පද්ධතියක් වන බැවින් එහි රඳා පැවැත්මට ප්‍රජාව සමඟ සබඳතා පැවැත්විය යුතුය.

පිළිතුරු

1.) √ 2.) X 3.) X 4.) √ 5.) √ 6.) X 7.) √ 8.) √ 9.)
X 10.) √

ඔබ පිළිතුරු නිවැරදි දැයි විමසා බලන්න. වැරදි ප්‍රතිචාර දක්වා ඇති නම් නිවැරදි පිළිතුර කවරේදැයි සොයා බලා ඔබේ දැනුම තවත් පුළුල් කර ගන්න.

ඔබ දැන් විෂය අන්තර්ගතය අධ්‍යයනය සූදානම්.

## 1. පාසල, ප්‍රජාව හා පාසල් ප්‍රජාව




පාසලකට ප්‍රජාවත් ප්‍රජාවට පාසලත් වැදගත් වන්නේ ඇයි ?

- ළමුන්ගේ සමාජානුයෝජනය සඳහා
- පුද්ගලයින් හඳුනා ගැනීමට හා තේරුම් ගැනීමට
- පුද්ගල හැකියා,ලැදියා, දක්ෂතා හා චර්යා හඳුනා ගැනීමට
- සමාජ සිරිත් විරිත්,ගති පැවතුම් හා නීති දැනගැනීමට
- බුද්ධි වර්ධනයට
- ගැටළු හඳුනා ගැනීමට, විසඳීමට හා තීරණ ගැනීමට
- ගවේෂණයට නිරීක්ෂණයට විමර්ශනයට
- සන්නිවේදනයට
- අත්දැකීම් හැඩගස්වා ගැනීමට හා බෙදා ගැනීමට
- සැමගේ ආදරයට හා ආරක්ෂාවට සමාජය තුළ සහජීවනයෙන් වීසීමට හැකියාව ලබා ගැනීමට



# ප්‍රජාව

නිර්වචන සහ හඳුන්වා දීම්

"ප්‍රජාව තමා කෙන්ද්‍රකරගෙන අතීතයේ හඳුන්වාදී ඇත."

**"ප්‍රජාවන් එකිනෙකට වෙනස් හෝ විවිධ වූ අවශ්‍යතා ඇති විවිධ ජනවාර්ගික, ආගමික හා සමාජ-ආර්ථික කණ්ඩායම් වලින් සමන්විත වේ".**


"කුඩා හෝ විශාල සමූහයක් පොදු ජීවිතයකට අවශ්‍ය මූලික තත්ත්වයන් හවුලේ භුක්ති විඳිමින් එකට ජීවත් වන්නේ නම් එවැනි සමූහයක් ප්‍රජාවක් යැයි කිව හැකිය"

ආර්.එම්.මැක් අයිවර් හා චාල්ස්.එම්.පේජ්


"ප්‍රදේශයට සීමා නො වුව ද එකිනෙක පුද්ගලයින් අතර ඇතිවන උනන්දු ඔස්සේ ප්‍රජාවක් ගොඩනැගිය හැකිය." - මෙල්වින් මේබර්ගේ

**"ප්‍රජාව යනු යම් ප්‍රදේශයක, යම් සේවාවන් සිදු කෙරෙන ස්ථානයක හෝ විවිධ වූ විශේෂිත කණ්ඩායමකට අයත් මිනිසුන් කොටසකි. "**

"ප්‍රජාවක් යනු සමාජ අන්තර් ක්‍රියාවලියකින් බැඳුණු ජන සමූහයකි. මේ අන්තර් ක්‍රියාවලිය මගින් එම ජන සමූහය තුළ ආකල්ප හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයෙන් ඇති කරනු ලැබේ.ඒ මගින් ප්‍රජාවෙහි අන්‍යෝන්‍ය යැපීම, සාමූහිකත්වය සහ ඒකාබද්ධතාවය වර්ධනය කෙරෙයි. "





විවිධ ප්‍රජා වර්ග
තමා වැඩ කරන ස්ථානයේ අය
තමා සමග එක් ප්‍රදේශයක වාසය කරන අය
ආගමික හෝ දේශපාලන හෝ සංස්කෘතික කටයුතු වලට සම්බන්ධ අය
මිත්‍ර සමූහ ආදිය


School
Student learning
Family
Community

**පාසල**

අනිවාර්ය විෂය මාලාවක් උදෙසා පූර්ණකාලීනව පැමිණීම අවශ්‍ය වන්නා වූ, වයස විශේෂී සහ ගුරු සම්බන්ධිත ක්‍රියාවලියක් ලෙස පාසල හැඳින්විය හැකිය. - ඉවාන් ඉලිච්

පාසලේ කාර්ය භාරය




මානව සබඳතා මගින් විෂයමාලා හා විෂය සමගාමී අත්දැකීම් ලබා දීමේ ක්‍රියාවලිය පාසලට ම ආවේනික ලක්ෂණයකි. මේ නිසා පාසලක මානව සබඳතා අභ්‍යන්තර හා බාහිර ලෙස කොටස් දෙකකට වර්ග කෙරෙයි.


## 2 පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතාවය




පාසල් ප්‍රජාවක් යනු පොදු සංවර්ධනාත්මක අපේක්ෂාවෙන් යුතුව පාසල සමග සබඳතා පවත්වන ජන සමූහයක් ඕනෑම අධ්‍යාපන ආයතනයක ප්‍රජා සබඳතා එහි සංවර්ධනයට අවශ්‍ය වේ. ප්‍රජා සබඳතා යනු පාසලක, සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව සහභාගිවන සම්පත් සබඳතා වේ. පාසල ප්‍රජාවගේ ය. ප්‍රජාව පාසලේ ය.

පාසලට ළමුන් සපයන්නේත් පාසලෙන් ළමුන් ආපසු භාර ගන්නේත් ප්‍රජාවයි.

e-Learning by TEA
Teacher Education Administration Branch





පාසැල් ප්‍රජා සබඳතා ස්වරූපයන් දෙකක් පැවැත්වේ.

- පාසල ප්‍රජාවෙන් යැපීමේ තත්ත්වය
- පාසල හා ප්‍රජාව අතර අන්‍යෝන්‍ය වශයෙන් අ ර්ථවත් වන සම්පත් හුවමාරු වීමේ


# 3 ගුරුවරයා සහ පාසල් ප්‍රජාව

ගුරුවරයෙකු සතු විය යුතු කුසලතා අතර සන්නිවේදන කුසලතාව, ඵලදායී අන්තර් පුද්ගල සම්බන්ධතා කුසලතාව, ළමයා හඳුනා ගැනිමේ කුසලතාව මෙන්ම ප්‍රජාව සමඟ සබඳතා පිළිබඳව ද වඩා වැඩි අවධානයක් යොමුවී ඇත.

ගුරුවරයාට ශිෂ්‍ය හඳුනා ගැනීමේදී ඒ සඳහා බලපාන ප්‍රබල සාධකයක් ලෙස ද පාසල් ප්‍රජාව අපට දැක්විය හැකිය.




- ❖ පාසලේ අභ්‍යන්තර ප්‍රජාව සමඟ යහපත් සන්නිවේදනයක යෙදීමට
- ❖ ඉගැන්වීමට අවශ්‍ය ක්‍රම ශිල්ප තෝරා ගැනීමට
- ❖ දරුවන් ඉගෙන ගන්නා ආකාරය හා විවිධත්වය හඳුනා ගැනීමට (ඉගැන්වීමේදී නව ව්‍යවහාරයන් සා ර්ථක කර ගැනීමට අවධානය යොමු කළ යුතුය. එහිදී ඉගැන්වීම්ට පෙර වූ දරුවා ගැනත් ඉගැන්වීමෙන් පසු දරුවා ගැනත් දැනගත යුතුය.)
- ❖ දරුවන්ගේ අපේක්ෂා තේරුම් ගැනීමට හා පැහැදිලි කර ගැනීමට
- ❖ ප්‍රජා අපේක්ෂාවන් තේරුම් ගැනීමට හා හඳුනා ගැනීමට (දෙමවුපියන්ගේ අපේක්ෂණ ද ඇතුලත්ව -හරිත ලොවක් ගොඩනගා නගා ගැනීමට අවශ්‍ය පුද්ගල පෞරුෂ සංවර්ධනය කිරීමට නම් ගුරුවරයා ශිෂ්‍යයාගේ අපේක්ෂාවන් හා එම ශිෂ්‍යායන්ගේ දෙමවුපිය අපේක්ෂා ගැනද සවිමත් විය යුතුය දෙමව්පියන්ගෙන් ඉගෙන ගන්නා දරුවා එම අත්දැකීම් සහිතව පාසලට පැමිණෙන බව අමතක නොකල යුතුය).
- ❖ සමාජ අපේක්ෂාවන් දේශීය අපේක්ෂාවන් ජාත්‍යන්තර අපේක්ෂාවන් පැහැදිලි කර ගැනීමට ප්‍රජා සබඳතා ඉවහල් වේ.



## 4 පාසල හා ප්‍රජාව අතර අන්තර් සබඳතාවය බල පවත්වාගෙන යන ආකාරය

**පාසල සහ ප්‍රජාව අතර සහසම්බන්ධතාව පරිසරයට එකඟ ව පාසලේ සංවර්ධය සඳහා ශක්තිමත් කළ යුතු ය. පාසල ප්‍රජාවේ 'ප්‍රදීපස්ථම්භයක්' විය හැකි ය. මන්දයත්, ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා වූ දැනුම් සම්භාරයක් පාසලක ගුරු මණ්ඩලය සතුව ඇති හෙයිනි. සෞඛ්‍ය, පෝෂණය, පවුල් සුභසාධනය, කෘෂිකර්මය සහ වෘත්තීය කුසලතා ඉන් සමහරක් වේ. මෙය යථාර්ථයක් බවට පත්කිරීමට නම්, පාසලත්, ප්‍රජාවත් අතර සම්බන්ධතාවන්**

### ප්‍රජා සහභාගිත්ව ස්වභාවයන්

**නිශ්ක්‍රිය සහභාගිත්වය**

- පැමිණීමෙන් පමණක්
- අදහස් ප්‍රකාශ කිරීමෙන් පමණක්
- විරුද්ධ වීමෙන් පමණක්
- ප්‍රතිචාරවලට අවනත වීමෙන් පමණක්
- පැවරෙන කාර්යය අවසන් කර තම වගකීම ඉටුකිරීමෙන් පමණක්

**ඵලදායි සහභාගිත්වය**

- ඉලක්ක කරා ළඟාවීමට
- ගැටළු හඳුනාගැනීමෙන්
- විකල්ප යෝජනා ඉදිරිපත් කිරීමෙන්
- ප්‍රශස්ත යෝජනා ක්‍රියාත්මක කිරීමෙන්
- පැන නගින ගැටලු වලට විසඳුම් සොයමින් ඉදිරියට යාමෙන්

ප්‍රජාවේ විවිධ සහභාගීත්ව අතර ප්‍රබල සාධකයක් ලෙස දෙමාපිය/ භාරකරු **සහභාගීත්වය**

- **දරුවන්ගේ අධ්‍යාපනික හා චිත්තවේගීය වර්ධනය සඳහා දෙමාපියන්ගේ සහභාගීත්වය පාසැලට**

  දෙමාපියන්ගේ මැදිහත්වීම මගින් සිසුන්ගේ හැසිරීම, පැමිණීම සහ ජයග්‍රහණය වැඩි දියුණු කළ හැකි බව පර්යේෂකයින් පෙන්වා දී ඇත. දෙමව්පියන්ගේ මැදිහත්වීම අර්ථ දැක්විය හැක්කේ තම දරුවාගේ අධ්‍යාපනයට දෙමාපියන්ගේ හෝ රැකබලා ගන්නෙකුගේ ක්‍රියාකාරී හා අඛණ්ඩ සහභාගීත්වයයි.

  ගෙදර වැඩ සඳහා උදව් කිරීම, පාසැලේ සිදුවන දේ ගැන කතා කිරීම, පාසැල් සිදුවීම් වලට සහභාගී වීම

- **අධ්‍යාපනයේ දී අපේක්ෂා කරන සහජීවනය දරුවන්ට දැනෙන පරිදි දෙමාපියන් සහ පාසල එකම මාවතක ගමන් කළ යුතුය.**

  චිත්තවේගීය හා අධ්‍යාපනික වශයෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැක්කේ මේ ආකාරයෙන් පමණි.දැනට පවතින පාසල් වැඩිදියුණු කිරීමේ මූලපිරීම්වල අත්‍යවශ්‍ය අංගයක් වුවද පාසල් ප්‍රතිසංස්කරණ සඳහා කැපවී සිටින වෘත්තිකයින්ට පාසලේ දෙමාපියන්ගේ සහභාගීත්වය අඛණ්ඩ ව අභියෝගයකි.

**දෙමාපියන් ට පාසලට සම්බන්ධ වීමට ඇති බාධක කීපයක්**

- පාසල, දෙමව්පියන් ට පාසලේ කටයුතු කළ නොහැකි යැයි සිතීම.
- දෙමාපියන් ට අමතර කාලයක් නොමැති නිසා
- **පාසල සහ පවුල් අතර සම්බන්ධතාවය නොමැතිකම.**
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ වෘත්තිකයන්,දෙමව්පියන් සමඟ සබඳතා පැවැත්වීම ඔවුන්ගේ රැකියාවන්හි ආතතියකට හේතු විය හැකි බව සිතීම .
- දෙමව්පියන්, පාසල විසින් ඔවුන් පිළිගන්නේ නැති බව සිතීම.

**දෙමාපියන් පාසලට සම්බන්ධ වන්නේ කෙසේද?**

- **දෙමාපියන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීමෙන් සාර්ථක සම්බන්ධතාවයක් ඇති කර ගත හැකිය.**

  පාසැලට සහභාගී වීමට ඔවුන් දරන උත්සාහය වටී යැයි දෙමාපියන්ට හැඟීම අවශ්‍ය වේ. තමන්ට අදාල දෙමාපියන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට, දරුවන්ගේ සංවර්ධන අවධීන්

e-Learning by TEA
Teacher Education Administration Branch

පිළිබඳ තොරතුරු සැපයීමට සහ ඉගෙනීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රායෝගිකව සියලුම පාසල් දෙමාපියන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කළ යුතුය.

**උදාහරණ:**

- **සන්නිවේදනය.**

  පවුල් සමඟ සන්නිවේදනය වැඩි දියුණු කිරීමට සහ දරුවන්ගේ ප්‍රගතිය සාකච්ඡා කිරීමට පාසලට හැකිය.

- **ස්වේච්ඡා සේවය.**

  දෙමව්පියන්ට තම දරුවාගේ පාසලට පැමිණ පාසලේ හෝ පන්ති කාමරයේ පරාර්ථකාමී සහ සමානාත්මතාවයෙන් වැඩ කිරීමට අවස්ථාව ලබා දෙයි.

- **නිවසේදී ඉගෙනීම.**

  දෙමව්පියන්ට ගෙදර වැඩ අධීක්ෂණය කිරීමට සහ උපකාර කිරීමට හැකි වන පරිදි ඉහළ අපේක්ෂාවන් සහ උපාය මාර්ග තුළින් නිවසේදී ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම .

- **තීරණ ගැනීම.**

  තීරණ ගැනීමේදී, දෙමාපියන් පාසල් සංගම්වල සාමාජිකයෙකු වන විට පාසලේ පැත්තෙන් සිටිය හැකි අතර එමඟින් පාසලේ සිටින සෑම කෙනෙකුටම බලපෑම් කරන තීරණ ගැනීමට හැකි වේ.

e-Learning by TEA
Teacher Education Administration Branch



# 5. ඵලදායි පාසල් ප්‍රජා සබඳතා වැඩසටහන් සංවිධානය

**ප්‍රජා සහයෝගීතාව**

ප්‍රජා සහයෝගීතාවය යනු විශේෂයෙන් පාසලේදී ප්‍රජාව තුළ පවුලේ සහභාගීත්වය දිරිගැන්වීම සඳහා වන උපාය මාර්ගයකි.

**ප්‍රජා සහභාගීත්වය**

සමාජයට, පරිසරයට හිතකර යම් වැඩසටහන් **ක්‍රියාත්මක කිරීමට, විවිධ කණ්ඩායම්වලට අයත් ප්‍රජාවන් දක්වන සහභාගිත්වය, ප්‍රජා සහභාගිත්වයයි.**

**ඵලදායි පාසල් ප්‍රජා සබඳතා වැඩසටහන්**

අපේක්ෂිත චර්යාමය වෙනස්කම් සිසුන් තුළ සිදුවීමට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් වාතාවරණයක් පවත්නා පාසල ඵලදායි පාසලකි.

ඉගෙනුම් ඉගැන්වීම් වාතාවරණය සංවර්ධනාත්මක ප්‍රගතියට තුඩු දෙන ලෙස සංවිධානය වූ ප්‍රජා සබඳතා වැඩසටහන් ,ඵලදායි පාසල් ප්‍රජා සබඳතාවයකි . (මෙහිදී වර්තමානයේ ළමා මිතුරු පාසල් හා තිරසාර සංව ර්ධන සංකල්පය වැඩි අවධානයට පාත්‍රවේ.එබැවින් ඒ සඳ හා වන ප්‍රමිති හා නිර්ණායක පිළිබඳවද අවධානය යොමු කළ යුතුය.)

වැඩිදුර කියවීම සඳහා (ළමා මිතුරු ප්‍රවේශය පිළිබඳ උපදෙස් සංග්‍රහය)



## ප්‍රජා සහභාගීත්වයට අදාල සංකල්ප

**W5**

**What?**
**Why?**
**Where?**
**When?**

**M5**


**Man**
**Money**
**Method**
**Material**
**Minutes**

**PDCA**

**Plan**
**Do**
**Check**
**Act**

**SWOT**

**Strengths**
**Weaknesses**
**Opportunities**
**Threats**





## ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්


**1.** එක් දින වැඩසටහන්
උදා - ශ්‍රමදාන, පා ගමන්, වීදි නාට්‍ය, කඳ වුරු (වෛද්‍ය,ප්‍රජා සෞඛ්‍ය වැනි), දැනුවත් කිරීම්


**2.** නිශ්චිත කාල වකවානුවක් පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්
උදා - විවිධ ව්‍යාපෘති, පරිසර සංරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් , ළමා සංව ර්ධන වැඩසටහන්, පෝෂණ වැඩසටහන්

**3.** දී ර්ඝ කාල වකවානුවක් පුරා ක්‍රියාත්මක වන වැඩසටහන්
උදා - පරිසර සංරක්ෂණය සඳහා
පැළ රෝපණය කිරීමේ වැඩසටහන්
ඩෙංගු පාලන වැඩසටහන් ,කසළ කළමනාකරණ වැඩසටහන්



## ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට




ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් සඳහා

- ❖ නියමිත කාලයක්
- ❖ ශක්තිමත් නායකත්වයක්
- ❖ මනා සැලැස්මක්
- ❖ අවස්ථා කළමනාකරණයක්
- ❖ ශ්‍රම විභජනයක්
- ❖ මූල්‍ය ප්‍රතිපාදන
- ❖ ආහාරපාන (අවශ්‍ය අවස්ථාවල)
- ❖ යටිතල පහසුව
- ❖ ක්‍රියාත්මක වීමක්
- ❖ එකම කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන ප්‍රජාවක්
- ❖ වැඩසටහන තුළින් හැකියාවන් සහ නොහැකියාවන් හඳුනා ගැනීමක්
- ❖ පසු විපරමක් උවමනා වේ.



## එලදායි පාසල් ප්‍රජා සබඳතා අරමුණු සංවිධානය, මෙහෙයවීම, පාලනය

# සංවිධානය

### ක්‍රමවත් සංවිධාන ව්‍යුහයක්

1. එක් අයෙකුට අයත් කටයුතු වගකීමෙන් කිරීම.

2.කටයුතු කරන ක්‍රමය අදාළ නීතිරීති පිළිවෙත් ආදිය නිශ්චය කිරීම

### අරමුණු හඳුනා ගැනීම

1.ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සංවර්ධනයට සම්බන්ධ අරමුණු

2. පාසලේ අනන්‍යතාවය ප්‍රජාව තුළ තහවුරු වන අරමුණු

### අවශ්‍ය සම්පත් හා සම්පත් සම්පාදන ක්‍රියාමාර්ග තෝරා ගැනීම

1.උපකරණ 2. පුද්ගලයින් 3.කාලය

### ක්ෂේත්‍රය හඳුනා ගැනීම

තොරතුර රැස්කර ප්‍රමුඛතා හඳුනා ගත යුතුය.පන්තියේ ශිෂ්‍යයන් හා සම්බන්ධ පාසල් ප්‍රජාව පිළිබඳ නිවැරදි තොරතුරු එකතුවක් ඔබ සතුව තිබිය යුතුය. ඔවුන්ගේ ආකල්ප, හැකියාවන්, සමාජ මට්ටම, ආර්ථික මට්ටම, පිළිබඳ සරල දැක්මක්, දැනුමක් ඔබ සතු විය යුතුය.

මේ ස හා නිරීක්ෂණ, වාරතා, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ,ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගැනීම, පාසලේ පැරණි වාර්තා පරීක්ෂා කිරීම

ප්‍රමුඛතා අනුව ගොඩනගාගැනීම

# මෙහෙයවීම

### අධීක්ෂණය

### තීරණ ගැනීම්

ක්‍රියාපටිපාටි යන්හි දී විකල්පයන් අතරෙන් වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ග තෝරාගැනීම

තෝරාගත් ක්‍රියා පටිපාටියට පරමාර්ථ හා අරමුණු වලට බාධාවක් වන විට එයට අදාළ ක්‍රියාමාර්ග ගැනීම

ගැටළු වලට හේතු නිශ්චය කර ගැනීම ගැටළු අනුපිළිවෙල විශ්ලේෂණය කිරීම

### පෙළඹවීම්

### කටයුතු ඉදිරියට මෙහෙය වීම

### නායකත්වය සැපයීම




සැලසුම් සමඟ සසඳමින් කාර්ය සාධනය ඇගයීම

පාසල් ප්‍රජා සබඳතා පාලනය

කාර්ය සාධනය හා නිවැරදි ක්‍රියාමාර්ග ස්ථාවර කිරීම

පරමාර්ථ වලට අදාළ නිවැරදි ක්‍රියාමාර්ග., වාර්තා කිරීම් හා සන්නිවේදනය



**ආශ්‍රිත ග්‍රන්ථ හා වෙබ් අඩවි:**


ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනත

ළමා මිතුරු ප්‍රවේශය පිළිබඳ උපදෙස් සංග්‍රහය

ඒස්. ගලගම. අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම

Bray, M. 2001. *Community Partnerships in Education: Dimensions, Variations and Implications*. Paris: UNESCO. Retrieved from: http://unesdoc.unesco.org/images/0012/001234/123483e.pdf

De Grauwe, A. 2004. School-Based management (SBM): does it improve quality? Background paper prepared for the Education for All Global Monitoring Report 2005. Paris: UNESCO. Retrieved from: http://unesdoc.unesco.org/Images/0014/001466/146639e.pdf

Education Policy and Practice Department. 2008. ‘Parent, Family, Community Involvement’. In: *Education*. Policy Brief. Washington D.C.: Education Policy and Practice Department. Retrieved from: http://www.nea.org/assets/docs/PB11_ParentInvolvement08.pdf.

Nhan-O’Reailly, J. 2013. ‘It Takes A Community to Learn!’ Blog in Global Partnership for Education. Retrieved from: https://www.globalpartnership.org/blog/it-takes-community-learn.

Sujatha, K. 2011*a*. ‘Module 4: Managing External Relations’. In: *Improving school management from successful schools* (pp. 192-210). ANTRIEP (Asian Network of Training and Research Institutions in Educational Planning), NUEPA (National Institute of Educational Planning and Administration). Retrieved from http://unesdoc.unesco.org/images/0022/002205/220543E.pdf

UNICEF (United Nations Children’s Fund). 2009*d*. Child Friendly Schools Manual . New York: UNICEF. Retrieved from: https://www.unicef.org/publications/files/Child_Friendly_Schools_Manual_EN_040809.pdf.